සැ.යු.- 2016.05.06 දින පළ වූ අංක 1,966 දරන *ගැසට් පත්‍රයේ* III හා IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,967 - 2016 මැයි මස 13 වැනි සිකුරාදා - 2016.05.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 844 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 847 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 851 |


*සැ. යු.* - බී. වයි. තුඩාවේ සමාජ සත්කාරක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මාර්තු මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජුනි මස 03 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## පානදුර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම - විවෘත

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:-

| *අනු. අංකය* | *තනතුර හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහායක<br>III ශ්‍රේණිය<br>තනතුරු 01<br>වැටුප් කේත අංකය PL1-2016<br>මාසික රු. 24,250- 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 - රු.36,410 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සිංහල හෝ දෙමළ විෂයය ඇතුළුව විෂයයන් හයකින් සමත්වීම (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.) |
| 02. | ක්ෂේත්‍ර කම්කරු<br>III ශ්‍රේණිය<br>තනතුරු 01<br>වැටුප් කේත අංකය PL1-2016<br>මාසික රු. 24,250- 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 - රු.36,410 | 9 වසර (8 වැනි ශ්‍රේණිය) සමත් විය යුතු ය. |
| 03. | සෞඛ්‍ය කම්කරු<br>III ශ්‍රේණිය<br>තනතුරු 03<br>වැටුප් කේත අංකය PL1-2006<br>මාසික රු. 24,250- 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 - රු.36,410 | 9 වසර (8 වැනි ශ්‍රේණිය) සමත් විය යුතු ය. |

04. *පොදු සුදුසුකම් :*

(1) අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
(2) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
(3) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
(4) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

06. 6.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - **කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය**

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමේදී සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සාමාර්ථ ලබාගෙන ඇති විෂයයන් 06 හා සම්මාන 02ට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක (02) උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ. | 20 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | 50% |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

6.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - **ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමේදී සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| **මුළු ලකුණු** | 100 | |

6.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - **සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමේදී සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

07. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

(vi) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතුය.

(vii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(viii) පානදුර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

(ix) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී, බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවාගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවාගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01ක පරිවාස කාලයකට යටත්වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

(iv) මෙම බඳවා ගැනීම් කොන්දේසි හි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද බස්නාහිර පළාත් සහ මුල්‍ය නීති සංග්‍රහයට ද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලට ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

09. *සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය :*

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,

(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,

(v) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එක් සහතිකයක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතු ය),

(vi) පළපුරුද්ද පිළිබඳ සහතික,

(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

10. වෘත්තීය තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත ඇතුළත්, දක්වා ඇති ආකෘතිය අනුව තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් අදාළ සියලුම සහතිකවල පිටපත් ද සමඟින් 2016.05.31 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ලේකම් හා කාර්ය කර්තව්‍ය හා බලතල
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
පානදුර.

05-248

# පළාත් පාලන නිවේදන

## කොලොන්න ප්‍රාදේශීය සභාව

වාර වාර්තා ලබාගැනීම

කොලොන්න ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ. වී. පී. අයිරාංගනි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 139 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කොලොන්න ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමේ සහ සේවා සැපයීමේ කාර්යය පහසුකර ගැනීම සඳහා කොලොන්න ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඇති සියලුම දේපළ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය, වර්ෂ 2016 ක් වූ මාර්තු මස 28 වැනි දින තීරණ අංක 284 යටතේ ගන්නට යෙදුණ බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. පී. අයිරාංගනි,
ලේකම් හා සභාවේ බලතල කාර්යය හා
කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
කොලොන්න ප්‍රාදේශීය සභාව,
කොලොන්න.

2016 මාර්තු මස 28 වැනි දින,
කොලොන්න ප්‍රාදේශීය සභාව,
කොලොන්න.

**ඉහත කී තීරණය**

කොලොන්න ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ. වී. පී. අයිරාංගනි වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 139 වගන්තියේ සඳහන් බලතල ප්‍රකාරව කොලොන්න ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන්, කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමේ සහ සේවා සැපයීමේ කාර්යය පහසු කර ගැනීම සඳහා කොලොන්න ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ආකෘතියක් මඟින් එක් එක් පවුල් ඒකකයන්ගේ දේපලවලට අදළ තොරතුරු එක්රැස් කිරීම සුදුසු බවට තීරණය කරමි.

05-218

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත්වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට දැනුම්දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරි ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| අනු. අංකය | මාර්ගයේ නම | පටන්ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | දිග | පළල | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | ඕවිටගෙදර වත්ත සඳහා යන මාර්ගය | පොත්තපිටිය පාර | ජෝර්ජ් පෙරේරාගේ ඉඩම | 01. කේ. ජී. සී. කුලතුංග<br>02. කේ. ජී. ඩී. කොඩිතුවක්කු<br>03. ඩී. සිරිසේන | 01. කේ. එන්සා කොඩිතුවක්කු<br>02. ඩී. ජී. පෙරේරා<br>03. ආර්. පී. රූපසිංහ<br>04. කේ. කරුණාරත්න | මී. 130 | මී. 2.43 | 2204 |
| 02 | ක්‍රිස්ටෝපර් පාර හා ප්‍රගති මාවත සම්බන්ධ වන අතුරු මාර්ගය | කෙන්හින්ද මාවත | ප්‍රගති මාවත | 01. එස්. ගනේගෙදර<br>02. ඒ. එම්. ධනපාල<br>03. සුබෝධ තිලකරත්න<br>04. එස්. කේ. සේරසිංහ<br>05. පී. පත්මනාදන්<br>06. ඩග්ලස් සේවියර්<br>07. ආර්. මැනුවෙල් | 01. එන්. එල්. එස්. දයානි<br>02. එන්. ජයසුන්දර<br>03. වී. කදිරේසු<br>04. එම්. එච්. එම්. රාෆික් | මී. 168 | මී. 1.82 | 2470ඒ |
| 03 | වලව්වේ කුඹුර, රන්කොන්ද කුඹුර, බෙරවාංග දක්වා මාර්ගය | වලව්වේ කුඹුර | බෙරවාංග දක්වා | 01. එම්. ජී. ජේ. නවරත්න<br>02. අයි. එම්. රම්මැනිකේ<br>03. එම්. ජී. ජී. නවරත්න මැණිකේ<br>04. එම්. ජී. පී. නවරත්න<br>05. එම්. ජී. එච්. කේ. නවරත්න<br>06. ටී. එම්. කේ. ඇලිකේවල<br>07. එච්. එම්. සී. හේරත්<br>08. ඒ. රණතුංග | 01. පී. ජී. ඥාණවතී | මී. 275 | මී. 03 | 5894 |

05-377

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) "ආ" වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් අංක 1945 දරන 2015.12.11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කර පළ කරන ලද පහත සඳහන් මාර්ගය ඉදිරියෙන් දක්වා ඇති දිග හා පළල අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු දේපළක් ලෙසට සලකා නඩත්තු කරනු ලබන බවට ප්‍රසිද්ධ කරනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2016 අප්‍රේල් මස 22 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | පාරේ නම | මායිම් සීමාව සිට දක්වා | දිග | පළල |
|---|---|---|---|---|
| 01 | රාජගිරිය, රාජගිරිය පාර 2 වන පටුමග | 56/10-56/13,62,68,68/2,68/4,68/5,68/6,68/6ඒ,68/6ඒ1/1,68/7 68/7ඒ,68/7බී,68/8ඒ,68/8ඒ1/1,68/9,68/10,68/11,68/11ඒ,72,88 | 375' | 8' සිට 10' දක්වා |

05-204

---

## මහනුවර මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවක්, එහි සඳහන් ස්ථානයන්හි පැවැත්වීම සඳහා 2016 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම පිණිස මා වෙත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලා වලට බලපත්‍ර දීමේ පනතේ 06 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාවක් අසල හෝ එකී සමාජ ශාලාවන් සඳහා අපේක්ෂිත ස්ථානයක් අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට සති 04ක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | සමාජ ශාලාවේ සභාපති ද ලේකම් ද යන වග | සමාජ ශාලාවේ නම | සමාජ ශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය |
|---|---|---|---|
| ලේකම් | ලේකම් | ද කැන්ඩි ස්පෝට්ස් ක්ලබ් | තිත්තවෙල, මහනුවර. |

මහනුවර පුරපති.

2016 අප්‍රේල් මස 20 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

05-165

---

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටු කරන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සිංගප්පුලි ආරච්චිගේ චින්තක කුමාර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 139 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දේපල හිමිකරුවන්ගෙන් වාර වාර්තා ලබා ගැනීමට අදළ පහත තීරණය 2016.03.21 වැනි දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශය ද සලකා 2016.03.21 දින අංක 459 යටතේ ගන්නට යෙදුනු බවත්, මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඉහත කී තීරණය

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සිංගප්පුලි ආරච්චිගේ චින්තක කුමාර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 139 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු පැනවීමට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට සහ අක්කර බද්දේ කාර්ය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීමට එම ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ අයිතිකරුවන්ගෙන් වාර වාර්තා ලබා ගැනීමටත්, එකී වාර වාර්තා සභාව මගින් නියම කරනු ලබන දිනයේ දී අංක 01 උපලේඛනයේ සඳහන් ආකෘතිය අනුව පුරවා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙනැවිත් බාර දෙන ලෙස එම දේපල හිමිකරුවන් වෙත විධානය කිරීම සුදුසු බවටත් මම තීරණය කරමි.

එස්. ඒ. චින්තක කුමාර,
ලේකම්,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව, තුංකම.

2016 අප්‍රේල් මස 06 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

අංක 01 උපලේඛනය

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමේ සහ සේවා සැපයීමේ කාර්යය ඉටුකිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඇති සියලුම දේපළ, කර්මාන්ත, ව්‍යාපාර පිළිබඳ තොරතුරු ලබාගැනීම.**

**(අනවශ්‍ය වචන කපා හරින්න.)**

01. පොදු තොරතුරු

I. ගෘහ මූලිකයාගේ නම :——————————.
II. ස්ථිර ලිපිනය :——————————.
III. ජා. හැ. අංකය :——————————.
IV. දුරකථන අංකය ස්ථිර :——————————. ජංගම :——————————.
V. පදිංචිකරු දේපළෙහි අයිතිකරු ද ? නැතහොත් කුලීකරුවෙක් ද ? :——————————.
VI. වරිපනම් අංකය :——————————. පාර/වීදිය :——————————.
(වරිපනම් අංකයක් නොමැති නම් ආසන්න දේපලෙහි වරිපනම් විස්තර සඳහන් කරන්න)

කුලීකරුවෙක් නම්,

VII. දේපල අයිතිකරුගේ නම :——————————.
VIII. කුලී ගිවිසුමක් තිබේ ද ? :——————————.
IX. මසකට ගෙවනු ලබන කුලී මුදල ? :——————————.

02. නිවස පිළිබඳ විස්තර (නිවසෙහි දළ සැලැස්මෙහි පිටපතක් අමුණන්න)

I. වහලය :- උලු සෙවිලි කළ/පොල්අතු/ඉලුක්/ටකරන්/ඇස්බැස්ටෝස්/වෙනත්
II. බිත්ති :- කටුමැටි/ගඩොල්/බ්ලොක් ගල්/පොල්අතු
III. බිම :- සිමෙන්ති/ටයිල්/ගොම/ටෙරාසෝ/ලී
IV. නිවසෙහි කාමර ගණන :——————————. විසිත්ත කාමර : ඇත/නැත
කෑම කාමරය :- ඇත/නැත මුළුතැන්ගෙය :- ඇත/නැත
V. ගොඩනැගිල්ලේ බිම වර්ග ඵලය කොපමණ ද ? වර්ග අඩි ——————————.
VI. ගොඩනැගිල්ල කෙතරම් පැරණි ද ? ——————————.
VII. නිවසට යාබද මාර්ගයේ පළල කොපමණ ද? ——————————.
VIII. නිවසෙහි යම්කිසි කොටසක් කර්මාන්තයක්/ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා යොදා ගන්නෙහි ද? ඔව්/නැත
IX. ඔව් නම් ව්‍යාපාරයේ/කර්මාන්තයේ ස්වභාවය : ——————————.
X. වැසිකිළි පහසුකම් :- ජල මුද්‍රිත/වල වැසිකිළි
XI. විදුලි බල සැපයුම තිබේ ද ? ඔව් /නැත
XII. ජල සැපයුම සපයා දෙන්නේ :- ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය/පළාත් පාලන ආයතනය/ප්‍රජා ජල ව්‍යාපෘති/වෙනත් මූලාශ්‍ර
XIII. නිවස අසල විදුලි පහන් කණු/දුරකථන කණු තිබේ ද ? ඔව්/නැත
XIV. ගොඩනැගිලි සැලැස්ම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මගින් අනුමත කර තිබේ ද ? ඔව්/නැත
XV. ගොඩනැගිල්ල සඳහා පළාත් පාලන ආයතනයේ බලපත්‍රය සහ අනුකූලතා සහතිකය ලබාගෙන තිබේ ද ? ඔව්/නැත

05-445

# විවිධ දැන්වීම්

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

2016 වර්ෂයට අදළව පහත ගාස්තු පැනවීම සංශෝධනය කිරීම

2015.12.11 දින අංක 1945 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ පලකර ඇති ගාස්තුවලින් පහත සඳහන් ගාස්තු සංශෝධනය කරන ලදී.

| *අනු. අංකය* | *වර්ගය* | *50Kg* රු. | *49Kg 30Kg* රු. | *29Kg 20Kg* රු. | *19Kg 10Kg* රු. | *10Kg අඩු* රු. | *පොදු ගාස්තු* රු. |
|---|---|---|---|---|---|---|---|
| 01. | හෝටල් | 5,000 0 | 2,500 0 | 2,000 0 | 1,000 0 | 500 0 | |
| 02. | මස්, මාළු, කුකුළු මස්,බිත්තර වෙළඳසැල් | 1,000 0 | 800 0 | 500 0 | 250 0 | 200 0 | |
| 03. | එළවළු පළතුරු වෙළඳසැල් | 2,000 0 | 1,000 0 | 500 0 | 300 0 | 200 0 | |
| 04. | සුපර් මාර්කට් | 2,000 0 | 1,000 0 | 500 0 | 250 0 | 200 0 | |
| 05. | කර්මාන්ත ශාලා | 2,000 0 | 1,000 0 | 500 0 | 200 0 | 100 0 | |
| 06. | තේ සිල්ලර සාප්පු | 1,000 0 | 500 0 | 250 0 | 200 0 | 100 0 | |
| 07. | තාවකාලික පදික වෙළඳ ස්ථාන | | | | | | 100 0 |
| 08. | අබලි ද්‍රව්‍ය | | | | | | 2,000 0 (ට්‍රැක්ටර ලෝඩ් එකක් සඳහා) |

සභාපති,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

05-376

---

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. චින්තක කුමාර වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය කියවීමේ දී එම පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල පළමු හා දෙවන කොටසේ අංක 01 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල අංක 21 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අන්තරාදයක, අප්‍රසන්න, අප්‍රසන්න හා අන්තරාදයක යන වෙළඳාම් වෙන් වෙන්ව හඳුනාගෙන පිළිගැනීම හා එම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2015.10.14 දින තීරණ අංක 251 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. චින්තක කුමාර,
ලේකම්,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 02 වැනි දින,
තුංකම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී තීරණය

1999.10.08 වැනි දින අංක 1101 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන වැළඳගත් බව මහජනතාව වෙත නිවේදනය කර ඇති 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 1988.08.23 වැනි දින අංක 520(7) දරන රජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලද්ද වූ ද 1990 දෙසැම්බර් 27 වැනි දින අංක 642/10 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ( IV වන කොටස) මගින් පළකල සබරගමුව පළාත් සභාවේ යෝජනාවකින් පිළිගන්නට යෙදුනු අනුමත කළ නිවේදනය පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල පළමු හා දෙවන කොටසේ අංක 01 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල අංක 21 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත අංක 01 සිට 03 දක්වා උපලේඛනවල සඳහන් අන්තරාදයක, අප්‍රසන්න, හා අන්තරාදයක යන වෙළඳාම් වෙන් වෙන්ව හඳුනාගෙන පිළිගැනීමටත් එම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමටත් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල

ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍යය ඉටු කරන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. චින්තක කුමාර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්ති සමඟ කියවීමේදී එම පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

**උපලේඛනය අංක 01**

I කොටස - අන්තරාදයක ව්‍යාපාර

| අනු. අංකය | කර්මාන්තයේ ස්වභාවය | *I වැනි තීරුව* රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | *II වැනි තීරුව* රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 1. | ග්‍රොසරි | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ගල් වල | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | හුණු නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සබන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ගල් ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | වෑල්ඩින් වැඩපලවල් | 500 0 | 750 0 | 1,000 0 |

***උපලේඛනය අංක 02***

II කොටස - අප්‍රසන්න ව්‍යාපාර

| අනු. අංකය | කර්මාන්තයේ ස්වභාවය | *I වැනි තීරුව* රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | *II වැනි තීරුව* රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 1. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බැටරි චාජ් කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | රස කැවිලි හා බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සිරප් හා පළතුරු බීම සකස් කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කුලුබඩු හා විවිධ ආහාර පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ශීත කළ මස්, මාලු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | බිත්තර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | කිරි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙනයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කුකුලු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ක්ෂණික ආහාර වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

*උපලේඛනය අංක 03*

III කොටස - අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාර

| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *I වැනි තීරුව* <br> *රු. 750 නොඉක්මවන අවස්ථාවක* <br> *රු. ශත* | *II වැනි තීරුව* <br> *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* <br> *රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* <br> *රු. ශත* |
|---|---|---|---|---|
| 1. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බැටරි චාජ් කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | රස කැවිලි හා බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සිරප් හා පළතුරු බීම සකස් කරන ස්ථානය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කුලුබඩු හා විවිධ ආහාර පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ශීත කළ මස්, මාලු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | බිත්තර වෙළදාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | කිරි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කුකුලු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ක්ෂණික ආහාර වර්ග නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

05-443

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.